TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර, කොළඹ 5

2019.10.25

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>පහසුකම්, ප්‍රදාන ලබාදීමක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත 2019.10.23 වන දින පස්වරු 2.00ට පමණ ලැබුණු පැමිණිල්ලකට අනුව හම්බන්තොට, අම්බලන්තොට ඡන්ද කොට්ඨාසයට අයත් තිස්සමහරාමය පොලිස් බලප්‍රදේශයේ බෙරලිහෙල අලුත් පොළ අසල සුනිල් මහතාගේ නිවාස තුළදී හා ලුණුගම්වෙහෙර කුඩා ගම්මාන 5 සද්ධාතිස්සපුර ග්‍රාම නිලධාරී වසම තුළ LJ-5477 ලියාපදිංචි අංක තහඩුව සහිත ලොරියකින් සිමෙන්ති බෙදා දීමක් සිදුකරන ලදී. අප ආයතනයේ දිස්ත්‍රික් මැතිවරණ නිරීක්ෂක විසින් මෙම සිද්ධිය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අප ආයතනයට තොරතුරු ලබාදුන් අතර එම අවස්ථාවේදීම හම්බන්තොට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට වාචික පැමිණිල්ලක් සිදුකරන ලදි. මෙම සිද්ධියට අදාළ ඡායාරූප මේ සමග අමුණා ඇත.

මෙසේ මැතිවරණ කාලසීමාව තුළ දී ගොඩනැගිලි ද්‍රව්‍ය බෙදාදීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 4 (III) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා දකුණු පළාත් සම්බන්ධීකාරක ධනුක ලක්මාල් මහතා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී,

Lakvijaya Bandara

ලක්විජය බණ්ඩාර
ජාතික සම්බන්ධීකාරක (PPPR)

Reg No. GA 279 | Chairperson: S.C.C. Elankovan | Company Secretary: Charuni Gunawardana | Directors: Anushika Amarasinghe, Shyamala Gomez, Camena Guneratne, Pavithra Kailasapathy, Shreen Saroor, T. Someswaran, Tony Senewiratne, Pulasthi Hewamanna



